විලදිමීර් ස්තෙපානෆ්
මායාකාරිය සහ
රාජ කුමාරයා
රුසියන් බසින් පරිවර්තනය එච්. ජයරත්න

බාබා-යාගා කියලා නපුරු මහලු මායාකාරියක් හිටියා. “මම ඉවාන් රාජ කුමාරයා මරලා දානවා” කියලා ඈ හිතුවා.

වංගෙඩියට නැගලා ඉදල අතට ගත් බාබා-යාගා රජ මාලිගාවට අහසින් ගියා. මාලිගාවේ දොරටුව ළඟදී බිමට බැහැලා, වංගෙඩියයි ඉදලයි පඳුරක් අස්සේ හංගලා කළු බැළලියකගේ වේශයක් මවාගෙන තාප්පයෙන් ඇතුළට පැන ගත්තා.

මාලිගාවේ මුරබල්ලන්ට බැළලියගෙ ඉව දැනිලා බුරාගෙන කන්න පැන්නා. ඒත් කපටි බැළලි දුවලා ගිහින් ඉවාන් කුමාරයාගේ කකුල් අතරේ දැවටෙමින් පුරු පුරු ගෑවා. කුමාරයාට දුක හිතිලා බැළලිට මාලිගාවේ නවතින්න ඉඩ දුන්නා.

එදා රෑ රාජ කුමාරයාට නින්ද ගියාට පස්සේ කළු බැළලි කුමාරයාගේ වතුර වීදුරුවට වස දමලා දොර අස්සේ හැංගිලා බලා සිටියා.

බැළලි ඇගේ කාමරයේ නැති බව දුටු පරෙවියා කුමාරයාගේ කාමරයට ගිහින් කේක් කෑල්ලකට කොට කොට ඉඳලා හොටෙන් ඇනලා වීදුරුවත් මේසයෙන් බිමට පෙරළුවා. වීදුරුව කෑලිවලට කැඩිලා බිඳිලා ගියා.

වීදුරුව බිඳුණු ශබ්දය ඇසුණු බාබා-යාගා, කුමාරයාගේ නිදන කාමරයට දුවලා ගිහින් පරෙවියා අල්ලාගෙන ඉවාන් කුමාරයා අවදි කරලා මෙහෙම කියනවා.

“මේ කුරුල්ලා ඔබව මරන්නයි හැදුවේ. ඌට දඬුවම් කරන්න.”

ඒක අහපු ඉවාන් කුමාරයා පරෙවියා කූඩුවට දමලා හිර කරන්නත් බාබා-යාගාට ඇතෙක් බරට වස්තුව දෙන්නත් නියම කළා.

ඊළඟ දවසෙ ඉවාන් කුමාරයා දඩයමේ යන්න සූදානම් වුණා. ඒ බව දැකපු බැළලි තමාවත් එක්කර ගෙන යන්න කියලා කුමාරයාට ඇවටිලි කළා.

“මම කුමරුනි, කැලේ හැම පාරක් තොටක්ම, හැම අස්සක් මුල්ලක්ම දන්නවා. මාත් එක්ක ගියොත් කැලේ අතරමං වෙන්නෙ නෑ.”

තමා කැමැතිම අශ්වයා පිට නැගුණු ඉවාන් කුමාරයා බැළලිට ඉදිරියෙන් යන්න අණ කළා. බැළලි අශ්වයාට ඉස්සරහින් යන අතරේ අශ්වයාගේ කකුල්වලට පෑගෙන්න යකඩ උල් පාර දිගේ දැම්මා. අශ්වයාගේ කකුලේ උලක් ඇනුණා. ඊට පස්සේ තවත් එකක්. ඊට පස්සේ තුන්වෙනි එකත් ඇනුණා. දැන් ඌට ඇවිදගන්න බෑ. යටි පතුල්වලින් ලේ ගලනවා.



කරන්න කිසිම දෙයක් නැහැ. ඉවාන් කුමාරයාට අශ්වයා පිටින් බිමට බහින්න සිදුවුණා. “දුක්වෙන්න එපා ඉවාන් කුමරුනි.” බැළලි කියනවා.

“මේ ළඟම පොකුණු දෙකක් තියෙනවා. එක පොකුණක මරණීය ජලය. ඒකෙන් තමයි බාබා-යාගා නාන්නේ. මූණකට හෝදන්නෙ. අනෙක් එකෙ ජීව ජලය. ඔබේ අශ්වයාට ඒ පොකුණේ වතුර බොන්න දෙන්න ඕනෑ. පොඩ්ඩක් ඉන්න. මං සැණින් ජීව ජලය ටිකක් අරන් එන්නම්.”

බැළලි පොකුණ දෙසට දුවගෙන ගියා. ඉවාන් කුමාරයා කල්පනා කරන්න පටන් ගත්තා.

“බැළලි වතුර ගේන්න බෝතලය අරන් ගියේ නෑනේ. ගිහින් බලන්න ඕනෑ.”



පොකුණෙ ඉවුර ළඟදී ඉවාන් කුමාරයාට බැළලි දකින්න ලැබුණා. බැළලි අතක් වතුරට දැම්මා. එතකොටම ඌ බාබා-යාගා බවට පත් වුණා. බාබා-යාගා අත් පුඩියක් ගැහුවා විතරයි ඉවාන් කුමාරයාගේ වතුර බෝතලය වගේම එකක් මැවුණා. ඒකට මරණීය ජලය පුරවාගත් බාබා-යාගා කකුලෙන් තුන් පාරක් පොළොවට තට්ටු කළා. එතකොට බාබා-යාගා ආයෙත් කළු බැළලිය බවට පත් වුණා.

“මේකයි එහෙනම් රහස නේද!”

ඉවාන් කුමාරයාට සියල්ල තේරුණා. ඔහු බළලිය වලිගයෙන් අල්ලලා මරණීය ජලය තියෙන පොකුණට වීසි කළා. ඊට පස්සේ ජීව ජලය තිබුණ පොකුණොන් වතුරත් අරන් අශ්වයා ළඟට ගියා.

අශ්වයාට වතුර පෙවූ කුමාරයා ගැඹුරු නින්දකට වැටුණා.

නිදාගෙන ඉන්න ඉවාන් කුමාරයාට හීනයක් පෙනුණා. මාලිගාවේ සුදුපාට පරෙවියා ඔහු එනතුරු මග බලාගෙන ඉඳිමින් මිනිස් කටහඬින් ඔහුට කතා කළා.

“ඉවාන් කුමරුනි, මට උදව් කරන්න. මං ඔබ මරණයෙන් ගලවා ගත්තා වගේම මාවත් මරණයෙන් ගලවා ගන්න.”

වහාම අසු පිට නැගුණු ඉවාන් කුමාරයා හැකි උපරිම වේගයෙන් මාලිගාවට ගියා. ඒ යන කොටත් පරෙවියා කූඩුව ඇතුළෙ පණ අඳිනවා. ඉවාන් කුමාරයා ජීව ජලය පරෙවියාගේ ඇඟට ඉස්සා. පරෙවියා ඇස් ඇරලා තටු ගහලා තරුණියක් බවට පත් වුණා. ඇගේ ලස්සන වචනයෙන් විස්තර කරන්න බෑ.

ඒ දෙන්නා එකිනෙකා ආදරෙන් ඉඳලා පසු කලෙක විවාහ වුණා. එච්චර වාසනාවන්ත ප්‍රීතිමත් යුවළක් තවත් මේ ලෝකේ ඉඳලා නෑ.

විලදිමීර් ස්තෙපානෆ්

මායාකාරිය සහ රාජ කුමාරයා

රුසියන් බසින් පරිවර්තනය

එච්. ජයරත්න

කුරුළු පොත් ප්‍රකාශකයෝ

594/1, නාවල පාර, රාජගිරිය දුරකථනය : 011-2863350/0718263282

Cover Design by H. Pradeep Darshana, Ragama. Tel : 0772876280

ISBN 978-955-591-280-8

මිල රු.